# මහාවිහාරය හා සංස්කෘතිය

ඕනෑම රටකට වාරණ අවශ්‍ය වෙයි. එමෙන් ම වාරණයක් නොමැති රටක් ද නැත. වාරණ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වෙයි. කිසිම රටක සමහරවිට ලංකාවේ තරම් නිදහසේ විවෘත ආර්ථිකය ක්‍රියාත්මක නොවනු ඇත. අද යුරෝපීය සංගමයේ රටවල් තවදුරටත් ලංකාවෙන් ඇඟලුම් සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක් ඒ රටවලට ආනයනය කිරීමට ඉඩ දෙන්නේ ද යන්න සාකච්ඡා කරයි. එමෙන් ම දේශපාලනයෙහි දී බටහිර රටවල් කරන ඇඟිලි ගැසීම් වාරණය කරන්නේ කෙසේ ද යන්න අනෙක් රටවලට ප්‍රශ්නයක් වී ඇත. අද බටහිරයන් ආරක්ෂාකිරීමට ඇති අයිතිය නමින් සංකල්පයක් නිර්මාණයකර මානව අයිතිවාසිකම් රැකීමේ මුවාවෙන් අනෙක් රටවල දේශපාලනයට මැදිහත් වෙයි.

සංස්කෘතික ක්ෂේත්‍රයෙහි අප කලින් සඳහන්කර ඇති ආකාරයට බටහිර රටවල සියුම් වාරණයක් පවතින නමුත් බටහිරයන් අපට කියා සිටින්නේ නිදහස් අදහස් ප්‍රකාශනයට කිසිදු වාරණයක් නොතිබිය යුතු බව ය. එහෙත් බටහිර විද්‍යාවෙහි ද බටහිරයන්ගේ සංස්කෘතියට බාහිර වූ අදහසක් ඔවුන්ගේ විද්‍යා සඟරාවක පළකරවාගැනීම අති දුෂ්කර කාර්යයක් වී ඇත. විද්‍යා සඟරාවක පළකරවාගැනීම සඳහා ලිපියක් යැවූ විට එය විමර්ශනයකිරීම සඳහා වෙනත් විද්‍යාඥයකුට හෝ දෙදෙනකුට හෝ යැවෙයි. සඟරාවේ සංස්කාරකවරයා ලිපිය පළකරන්නේ ඒ විමර්ශකයන්ගේ අනුමැතිය ලැබුණහොත් ය. විමර්ශකයන් විසින් යම් යම් දුර්වලතා ඇති කිපි ප්‍රතික්ෂේප කරනු ලැබෙයි. මේ ක්‍රමයේ වරදක් නැතැයි කිසිවකුට සිතෙනු ඇත.

කලින් පළකෙරුණු අදහසක් හෝ වැදගත්කමක් නැති ලිපියක් හෝ පළවීම ඉන් වැළැක්වෙනු ඇතැයි කිසිවකු කියනු ඇත. පුවත්පතක කවි පිටුව සකස්කිරීමේ දී ද එවැන්නක් සිදුවෙයි. කවි තෝරණ තැනැත්තාගේ රුචිකත්වය අනුව ඇතැම් කවි ප්‍රතික්ෂේප වෙයි. එහි ඇති වරදක් නැතැයි බොහෝ දෙනා කියනු ඇත. පුවත්පතකට ලැබෙන කවි සියල්ල පළකිරීමට පුවත්පතෙහි ඉඩ නොමැති බව කාහටත් වැටහෙයි. එහෙත් ප්‍රශ්නය වනුයේ කවි තෝරන්නාගේ හෝ ඇතැම්විට සෘජුව ම සංස්කාරකවරයාගේ හෝ රුචිකත්වයට නොගැලපෙන එහෙත් වෙනත් මිනුම් දණ්ඩකින් හොඳ යැයි කිවහැකි කවි තිබිය හැකි වීම ය. ඒ කවිවලට කුමක් සිදුවන්නේ ද?

අප තේරුම් නොගත්ත ද සෑම පුවත්පතකම යම් ආකාරයක වාරණයක් ක්‍රියාත්මක වෙයි. එසේ වාරණය කිරීම සඳහා සංස්කාරකවරු ද ඔවුන් විසින් බලය පවරනු ලැබූ වෙනත් අය ද වෙති. අපි සාමාන්‍යයෙන් ඔවුන්ට වාරණ මණ්ඩලයක් යැයි නො කියමු. එහෙත් ඇතැම් ලිපි, කවි ආදිය පාඨකයා වෙතට නොයැවීමෙන් කෙරෙන්නේ වාරණයකි. යමකු තමාගේ ම ලිපි එකතුවක් පළ කළ ද (ඒ ලෙහෙසි පහසු වැඩක් නොවන බවට බොහෝ දෙනකුට අවබෝධයක් ඇතැයි සිතමු.) එය බෙදාහැරීමේ දී ප්‍රශ්නවලට මුහුන දීමට සිදුවෙයි. එමගින් ද වක්‍රව වාරණයක් සිදුවෙයි.

කලින් කී පරිදි විද්‍යා සඟරාවල ලිපි, එනම් පර්යේෂණ ලිපි යැයි හැඳින්වෙන ලේඛන, පළකිරීමේ දී අධිපතිවාදී මතයට විරුද්ධ ලිපි සාමාන්‍යයෙන් පළ නො වෙයි. දැනට වසර කිහිපයකට පෙර ක්වොන්ටම් භෞතිකයේ සම්මත අර්ථනිරූපණය වූ කෝපන්හේගන් විවරණයට පටහැනිව යන පර්යේෂණ කිහිපයක් කළ ඉරානියානු ඇමරිකන් වැසියකු වූ අෆ්ෂා මහතාට තම ලිපි පළකරවා ගැනීමට අවුරුදු ගණනාවක් උත්සාහකිරීමට සිදුවිය. ඔහුට මරණ තර්ජන පවා එල්ල විය. ඔහුගේ ඇතැම් මතවලට අපි දු එකඟ නො වෙමු. එහෙත් ඒ ලිපි පළ වී අවුරුදු තුන හතරක් ගතවීමෙන් පසු අද පවා ඒ ගැන සාකච්ඡාවක්වත් බටහිර විද්‍යා සඟරාවල පළ නො වෙයි.

විද්‍යාවේ හෝ කලාවේ හෝ වාරණය යනු අන් හිසිවක් නොව තම සංස්කෘතියෙන් බාහිරව නිර්මාණයවන කෘතීන් සංස්කෘතියට ගන්නේ ද, අවශෝෂණය කරන්නේද, එසේත් නැත්නම් නොගන්නේ ද යන්න තීරණය කිරීම ය. බටහිරයෝ අද මේ සඳහා ඊනියා වාරණ මණ්ඩල පත් නොකර ම වාරණය කරති. එහෙත් එදා ඔවුනට ද වාරණ මණ්ඩල විය. අප වැනි රටවල වාරණ මණ්ඩල පත්කෙරෙන්නේ පැරණි බටහිර ක්‍රමය අනුගමනය කරමින් ය. අපේ රටවල අනුකාරක උගත්තු අද බටහිර ක්‍රමය දෙස මතුපිටින් බලා වාරණ මණ්ඩල අවශ්‍ය නැතැයි සිතති. එහෙත් මේ අනුකාරක උගතුන්ට නොතේරෙන දෙය නම් වාරණ මණ්ඩල නැතිව වාරණය කරන්නේ කෙසේ ද යන්න අද

© Prof. Nalin De Silva

බටහිරයන් දන්නා බව ය. අනෙක් අතට අද ලෝක ආධිපත්‍යය දරණ බටහිර සංස්කෘතියේ අංගෝපාංග සංස්කෘතික යටත්විජිතවාදය ඔස්සේ අප සංස්කෘතිය ආක්‍රමණය කිරීමට එරෙහිව කටයුතුකිරීම අවශ්‍ය වෙයි. අප වාරණය ඉවත්කළහොත් ඒ ඔස්සේ අපට අවශ්‍ය නොවන සියල්ල ද ගලා එනු ඇත.

බටහිර ක්‍රමයේ වාරණ මණ්ඩල අද අපේ රටවල පිහිටුවා ඇත. එහෙත් එහි ම වරදක් ඇත. අප වාරණ මණ්ඩල පිහිටුවා ඇත්තේ බටහිර අනුකරණය කරමින් ය. අද ව්‍යාජ ප්‍රබුද්ධයන් වාරණ මණ්ඩල අහෝසි කළ යුතු යැයි කියන්නේ ද මතුපිටින් බටහිර අනුකරණය කරමිනි. ප්‍රබුද්ධයන්ගේ අනුකරණය අමතක කරමු. ඔවුහු උපන්ගෙයි අනුකාරකයෝ වෙති. එහෙත් ආණ්ඩුව මැදිහත් වී වාරණ මණ්ඩල පිහිටුවන්නේ කිනම් අරමුණකින් ද?

මේ වැදගත් ප්‍රශ්නය ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට උපදෙස් දෙන අයගේ හෝ අවධානයට යොමු වී ඇතැයි නො සිතමු. මෙහි දී මේ ආණ්ඩුව පමණක් නොව පසුගිය ආණ්ඩු ද අපේ අවධානයට යොමු වෙයි. වාරණ මණ්ඩල පත්කෙරෙන්නේ සංස්කෘතිය රැකගැනීමේ අරමුණින් ය. වෙනත් සංස්කෘතීන්ගෙන් සෘජුව ම හෝ අපේ ම ඊනියා ප්‍රබුද්ධයන් මගින් හෝ මෙරට සංස්කෘතියට ඉතිහාසයට හා වෙනත් අදාළ දෙයට පහරක් වැදෙන අයුරින් ඒ යටපත්කෙරෙන අයුරින් නිර්මාණය වී අප රටට ලැබෙන කෘති ජනතාවට ලබාදෙන්නේ ද, ඉන් යම් ප්‍රමාණයක් ලබාදෙන්නේ ද, කිසිවක් ලබා නොදන්නේ ද යන්න විනිශ්චයකිරීම ආණ්ඩුව මහින් පත්කෙරෙන වාරණ මණ්ඩලවල කාර්යභාරය වෙයි.

එහෙත් මේ වාරණ මණ්ඩල පත්කෙරෙන්නේ බටහිර අච්චුවෙහි ය. එහි ම පරස්පරයක් වෙයි. අප කොණ්ඩය කැපුවේ සුද්දන් අනුකරණය කරමිනි. නැත්නම් ඔවුන්ගේ නියෝගවලට යටවෙමිනි. අද ඇතැමුන් කොණ්ඩය වවන්නේ ද සුද්දන් කිහිපදෙනකු අනුකරණය කරමිනි. එලෙස ම ආණ්ඩුව වාරණ මණ්ඩල පත්කරන්නේ ද, ව්‍යාජ ප්‍රබුද්ධයන් වාරණ මණ්ඩල අහෝසි කරන ලෙස කියන්නේ ද බටහිරයන් අනුකරණය කරමිනි. අද සංස්කෘතික යටත්විජිතවාදය ක්‍රියාත්මක වන බටහිරින් ම අප එයට විරුද්ධව කටයුතු කිරීමට ක්‍රමවේද සකස්කරගන්නේ නම් එහි ප්‍රශ්නයක් ඇති බව පැහැදිළි විය යුතු ය.

අපට එහි දී අපේ සම්ප්‍රදායෙන් උගත හැකි පාඩමක් වේ ද? අතීතයේ දී එවැනි වාරණ කළෝ කවරහු ද? රජතුමා විසින් පත්කරනු ලැබූ යම් මණ්ඩලයක් විසින් වාරණය සිදුකරන ලද්දේ ද? අපට දැනගත හැකි අයුරින් නම් වාරණය මහාවිහාරයේ කටයුත්තක් වී ඇත. මහායානය සම්බන්ධ සිද්ධිවල දී රජතුමාට විරුද්ධව කටයුතුකිරීමට ද මහාවිහාරයට හැකි වී තිබේ. මේ සම්බන්ධ හොඳම උදාහරණය මහසෙන් රජු සමයෙන් ගෙනහැර දැක්විය හැකි ය. මහසෙන් රජු දක්ෂිණ භාරතයෙන් පැමිණි සංඝමිත්‍ර නම් භික්ෂුවගේ අනුශාසකත්වය යටතේ වෛතුල්‍යවාදයට පක්ෂපාති විය. රජු මහාවිහාරය සමතලා කර උඳු වැපිරීමට කටයුතු කෙළේ ය.

මෙහි දේශපාලන මෙන් ම සංස්කෘතික ආක්‍රමණයක් විය. වෛතුල්‍යවාදී අදහස් ථෙරවාදයට පටහැණි විය. සොළී යැයි කියැවෙන සංඝමිත්‍ර භික්ෂුව දේශපාලන උපක්‍රමයක් ලෙස ද වෛතුල්‍යවාදී අදහස් මෙරට පතුරවන්නට ඇත. කෙසේ හෝ ඒ භික්ෂුව කුඩා කාලයේදී ම මහසෙන් කුමරු තම වසඟයට ගැනීමට සමත් වී ඇත. මහසෙන් කුමරු රජවීමෙන් පසුව නැවතත් ලංකාවට පැමිණි සංඝමිත්‍ර භික්ෂුව ථෙරවාදයට පහරගැසීමට රජු යොදාගත්තේ ය. එක්තරා ආකාරයකින් ගතහොත් පසු කලෙක කතෝලික සංස්කෘතිය පැතිරවීමට පෘතුගීසීන් දොන් ජුවන් ධර්මපාල රජුගේ සීයා වූ බුවනෙකබාහු රජු යොදාගත්තා මෙන් සංඝමිත්‍ර භික්ෂුව හා අනෙක් දේශපාලන හා සංස්කෘතික බලවේග විසින් මහසෙන් රජතුමා යොදාගනු ලැබ ඇත.

කෝට්ටේ යුගයේ මෙන් නොව මහසෙන් යුගයෙහි මහාවිහාරය (ථෙරවාදය) බලවත් විය. මහසෙන් රජු ගෝඨාභය රජුගේ යක්ෂ ගෝත්‍රික බිසවකගෙන් ලැබුණු පුතකු විය හැකි ය. එහෙත් අද සිටින මහාවිහාර විරෝධී, එබැවින් ම සිංහල බෞද්ධ විරෝධී ඇතැම් පඬියන් කුමක් කිව ද එදා බොහෝ සිංහලයන් මහාවිහාරය පැත්ත ගෙන ඇති බව පැහැදිළි ය. මහාමේඝවර්ණ සෙනෙවි මහසෙන් රජුට විරුද්ධ වී ඇත්තේ මහාවිහාරයේ පැත්ත ගනිමිනි. අවසානයේ දී රජු තම වරද පිළිගෙන මහාවිහාරය ප්‍රතිසංස්කරණය කරවී ය.

© Prof. Nalin De Silva

මේ කතාවෙන් කියැවෙන්නේ අනුරාධපුර සමයෙහි (සහ පසුව ද) මෙරට සංස්කෘතිය රජුට අවශ්‍ය ආකාරයට නොව මහාවිහාරික භික්ෂූන් වහන්සේට අවශ්‍ය ආකාරයට මෙහෙයවුණු බව ය. මෙරට ජනතාවට සංස්කෘතික වශයෙන් ගත්කල යහපත් කුමක් ද අයහපත් කුමක් ද යන්න තීරණය කෙරුණේ රජුට අවශ්‍ය ආකාරයට නොව මහාවිහාරයට අවශ්‍ය ආකාරයට බව ඉන් හෙළිවෙයි.

වෙනත් වචනවලින් කිවහොත් එකල සංස්කෘතික ආධිපත්‍යය රජුට නොව මහාවිහාරික මහාසංඝයාවහන්සේට තිබී ඇත. එකල වාරණ මණ්ඩලයක් තිබිණි නම් ඒ මහාවිහාරය ය. එහෙත් ඒ මණ්ඩලය රජු විසින් පත්කරන ලද්දක් නො වී ය. සංස්කෘතික කරුණු වල දී මහාවිහාරය රජුට වඩා බලවත් වූ බව ගැමුණු රජතුමාගේ කාලයේ සිට දක්නට ලැබෙන්නකි. වංශකතා ඉතිහාසය ලියන ලද්දේත් මහාවිහාරික භික්ෂූන් වහන්සේ වීම හේතුවෙන් උන්වහන්සේලා තමන්ට අවශ්‍ය ආකාරයට සංස්කෘතික ආධිපත්‍යය තමන්ට ලැබෙන සේ මහාවංසය ලියා ඇති බවක් අවශ්‍ය නම් කාහට හෝ කිව හැකි ය. එහෙත් තමන්වහන්සේට ඇති බලය ඒත්තු යන සේ ලිවීමේ අවශ්‍යතාවක් මහාවාහාරයට තිබිණි යැයි සිතිය නො හැකි ය.

අනෙක් අතට තමන්වහන්සේට නොමැති බලයක් ඇති බව පෙන්වන සේ මහාවංසය ලිවීමට මහාවිහාරික භික්ෂූන්වහන්සේ පෙළඹිණි යැයි සිතිය නො හැකි ය. එසේ නොමැති බලයක් ඇති සේ අඟවමින් පොත පත ලිවී නම් ඒ රජුගේ අප්‍රසාදයට හේතුවන්නට තිබිණි. එසේ අප්‍රසාදයට ලක්නොවීමෙන් පෙනී යන්නේ මහාවිහාරයට අඩුම තරමින් සංස්කෘතික වශයෙන් රජුට නොවූ බලයක් තිබුණු බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva